# සා. පෙළ. සිංහල

# රට වටා පද රටා

# ඒකකය- 14 වැඩපොත

- 10 ශ්‍රේණිය 03 ඒකකය - ප්‍රාදේශික ව්‍යවහාර
- 11 ශ්‍රේණිය 12 ඒකකය - බස ඉපදුණු සැටි අසනුය විස්තර
- 11 ශ්‍රේණිය 14 වන ඒකකය - රට වටා පද රටා

**(පසුගිය විභාග ප්‍රශ්නද ඇතුළත් කර ඇත.)**

**( පිළිතුරු සහිතයි )**



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

{ පෙළ පොත අභ්‍යාස සමඟ G10③ G11⑤ G11⑭ ඒකක ආවරණය වන පරිදි සකස් කර ඇත.}

## ➢ ප්‍රාදේශික ව්‍යවහාර

- කිසියම් ප්‍රදේශයකට විශේෂ වන භාෂා ව්‍යවහාර **ප්‍රාදේශික උපභාෂා** ලෙස හඳුනා ගත හැකි ය. කිසියම් ප්‍රාදේශික උපභාෂාවක් පැතිර පවත්නා ප්‍රදේශය **උපභාෂා කලාපයක්** වශයෙන් නම් කෙරේ. **රුහුණ, උඩරට, ඌව, දිගාමඩුල්ල, සත්කෝරළය, නුවර කලාවිය** ආදිය සිංහල භාෂාවේ ප්‍රධාන ප්‍රාදේශික උපභාෂා කලාප කිහිපයකි.
- එක් එක් ප්‍රදේශ වල ජනයා යමක් හැඳින්වීමට භාවිතා කළ වචනය ඒ ප්‍රදේශය අනුව වෙනස් වීම, බහුජන සන්නිවේදන මාධ්‍ය නොතිබීම, අධ්‍යාපනයට සමාන අවස්ථා නොලැබීම ආදී කරුණු මෙලෙස ප්‍රාදේශීය උපභාෂා ඇතිවීමට හේතු විය.

### ❖ රුහුණු උපභාෂාව

- රුහුණු උපභාෂාව යනු අද **දකුණු පළාත** වශයෙන් හැඳින්වෙන ප්‍රදේශයට විශේෂ වූ උපභාෂාව යි. වැල්ලබඩපත්තුව, ගඟබඩපත්තුව, හිනිදුම්පත්තුව, තල්පේපත්තුව, ගිරුවාපත්තුව, මාගම්පත්තුව යන ප්‍රදේශ ඊට අයත් වේ.

1. කුඹියා - ..................................................
2. ඔබ - ..................................................
3. පුංචි අම්මා - ..................................................
4. මුදුන - ..................................................
5. හිමිදිරිය - ..................................................
6. ලෙලි ගසනවා - ..................................................
7. මොකද - ..................................................
8. කරදිය - ..................................................
9. අපමණ වැඩ කිරීම - ..................................................
10. කුඩා - ..................................................

### ❖ උඩරට උපභාෂාව

- වර්තමාන **මධ්‍යම පළාත** වශයෙන් සැලකෙන කඳුකරයටත් **ඉහළ ඌව** ලෙස සැලකෙන කඳුකරයටත් හතර කෝරළයටත් විශේෂ වූ උපභාෂාව උඩරට ජන වහර වශයෙන් ගැනේ.

1. මීහරකා - ..................................................
2. හට්ටි - ..................................................
3. මඟුල් කපුවා - ..................................................
4. පණිවිඩය - ..................................................
5. හිතුවක්කාරයා - ..................................................
6. හිමිදිරිය - ..................................................
7. කරදරය - ..................................................
8. තලවනවා - ..................................................

### ❖ දිගාමඩුලු උපභාෂාව

- වර්තමාන **නැගෙනහිර පළාතට** හා **ඌව පළාතට** අයත් බිම්තැන්නපත්තුව, වැව්ගම්පත්තුව, පානම හා වෙල්ලස්සපත්තුව යන ප්‍රදේශවල ව්‍යවහාර වන බස් වහර යි.

1. මට - ..................................................
2. මහලු කත - ..................................................
3. බල්ලා - ..................................................
4. මීහරක් - ..................................................
5. වලසා - ..................................................
6. හොද්ද - ..................................................
7. කිරිබත් - ..................................................
8. හෙවණැල්ල - ..................................................
9. මල්වර වීම - ..................................................
10. රෝග වැළඳීම - ..................................................

## ❖ සත්කෝරලේ උපභාෂාව

- වර්තමාන **වයඹ පළාතට** අයත් වැඩවිල්ලිහත්පත්තුවටත් රජවන්නිය හා කුමාරවන්නිය ඇතුළත් දෙමළහත්පත්තුව යන ප්‍රදේශවලටත් විශේෂ වූ උපභාෂාව යි.

1. උදෑසන - ..................................................
2. රණ්ඩුව - ..................................................
3. පිරිමි ළමයා - ..................................................
4. මහන්සි වී වැඩ කිරීම - ..............................................
5. හමු වීම - ..................................................
6. උත්සාහ කරනවා - ..................................................
7. වගා ළිං - ..................................................
8. ජටාව - ..................................................
9. හේන් කෙටීම - ..................................................

## ❖ සබරගමු උපභාෂාව

- **රත්නපුර දිස්ත්‍රික්කයට** අයත් කුකුළුකෝරළය, අටකලන්කෝරළය, කොලොන්නකෝරළය යන ප්‍රදේශවලට විශේෂ වූ උපභාෂාව යි.

1. පදිංචි වීම - ..................................................
2. වැස්ස - ..................................................
3. අලි අල්ලන පුද්ගලයා - ..................................................
4. විශ්‍රාම ශාලා - ..................................................
5. අලි ඇල්ලීම - ..................................................
6. කුඩා නිවස - ..................................................

## ❖ නුවර කලාවියේ උපභාෂාව

- **උතුරුමැද පළාතට** අයත් නුවරගම් පළාත, හුරුලූගම් පළාත, කලාගම් පළාත යන ප්‍රදේශවලට විශේෂ වූ උපභාෂාව යි.

1. වැඩිමහලු සහෝදරයා - ..................................................
2. බිරිඳ - ..................................................
3. විවාහයට පෙර තරුණියගේ තොරතුරු විමසීම - ..........................................
4. නොහික්මුණු තැනැත්තා - ..................................................
5. පරම්පරාව - ..................................................
6. විවාහ වීම - ..................................................
7. අලුත් හේන - ..................................................
8. පැණිකොමඩු - ..................................................
9. බැවුම - ..................................................

- යම්කිසි අවස්ථාවක් හෝ ස්ථානයක් පදනම් කොට ගෙන නිශ්චිත සීමාවක් තුළ භාවිත වන භාෂා, **පරිමිත භාෂා** ලෙස හඳුන්වනු ලැබේ. විවිධ වෘත්තීන්, ආගමික ස්ථාන, විවිධ සමාජ කණ්ඩායම් හා අභිචාරමය අවස්ථා මුල් කොට ගත් භාෂා ව්‍යවහාර මීට අයත් වේ.
- ඒ අනුව **ධීවර, පතල්, හේන්** ආදි වෘත්ති ආශ්‍රිත භාෂා ව්‍යවහාර ද **ශ්‍රීපාද වන්දනාව, තොවිල්** වැනි අවස්ථා පදනම් කොට ගත් ව්‍යවහාර ද පරිමිත භාෂා ව්‍යවහාර වශයෙන් හඳුනා ගත හැකි ය.

## ❖ කමත් භාෂාව

1. කමතේ අළුවලින් යන්ත්‍රයක් ඇඳීම - ..........................................
2. දෑතින් අල්ලා ගත හැකි තරම් වූ ගොයම් ප්‍රමාණය - ..........................................
3. කොළ මැඩීමට හරකුන් එකට ඇඳා ගැනීම - ..........................................

4. ඇඳුත්තේ නායකයා - .........................................
5. ඇඳුත්තේ සෙසු හරක් සිවුදෙනා - .........................................
6. ගොන් දෙන්නකු යෙදූ කැරැල්ල - .........................................
7. කුල්ල - .........................................
8. පයින් ගොයම් පාගන විට එළන පැදුර - .........................................
9. වී මැනීමට භාවිත කළ උපකරණයකි. - .........................................
10. කාටුව බේරීමට භාවිත කරන උපකරණයකි. - .........................................

## ❖ ධීවර භාෂාව

1. මසුන් මැරීම - .........................................
2. දෙදෙනකුට පමණක් යෑමට හැකි ඔරු - .........................................
3. කුඹ ගස - .........................................
4. ධීවර කණ්ඩායමේ නායකයා - .........................................
5. ඔරු අයිතිකරුවා - .........................................
6. යොත - .........................................
7. වැහි කබාය - .........................................
8. දැල - .........................................
9. දැල් අදින පුද්ගලයෝ - .........................................
10. මාළු වෙළෙඳපොළ - .........................................

## ❖ හේන් භාෂාව

1. පාවහන් - .........................................
2. වයසක මිනිසා - .........................................
3. පක්ෂීහු - .........................................
4. පක්ෂීන්ට වෙන් කළ කොටස - .........................................
5. විශාල ගස් ද දැවී ගිය තැන් - .........................................
6. හේන් වපුරා උදලු ගෑ පසු කරු සහිත ලීයකින් රොඩු ඉවත් කිරීම
 - .........................................
7. අඳුර වැටෙන වේලාව - .........................................
8. අලියා - .........................................

## ❖ පතල් භාෂාව

1. කැට ගල් සහිත පස් තට්ටුව - .........................................
2. පස් සහ ඉල්ලම් ගොඩට ගැනීමට භාවිත කරන උපකරණයකි.
 - .........................................
3. හීන් යකඩ කුර - .........................................
4. නො වටිනා ගල් - .........................................
5. පතලේ පතුලේ සිට ඉල්ලම් ඇති දිශාවන්ට ඉල්ලම් කඩමින් යන මාර්ගය
 - .........................................
6. උදලු තලයක පමණ පස් දැමිය හැකි කුඩා කුඩයක්
 - .........................................
7. ඉල්ලම මැණික් වට්ටියට දැමීමට පෙර මහගල් කැට ඉවත් කරන කුඩය
 - .........................................
8. ගැරීමෙන් පසු පතුලේ ඉතිරි වන කොටස - .........................................
9. ඉහළ මිල කියූ තැනැත්තාට මැණික - .........................................

## ❖ ශ්‍රී පාද වන්දනාව ආශ්‍රිත භාෂාව භාෂාව

1. ශ්‍රීපාද අඩවිය - ..............................................
2. ශ්‍රීපාද කන්ද තරණය - ..............................................
3. වන්දනා කණ්ඩායම - ..............................................
4. කණ්ඩායමේ නියමුවා - ..............................................
5. ගුරා පළමු වරට වන්දනාවේ යන තැනැත්තා - ..................................
6. වන්දනාකරුවන්ගේ ගමන් මල්ල - ..............................................
7. වැස්ස වහිනවා - ..............................................

- උච්චාරණය කරන ආකාරය සහ භාවිතා වන වචන අනුව ප්‍රාදේශික උපභාෂා සහ පරිමිත භාෂා පොදු භාෂාවෙන් වෙනස් වේ.
- ප්‍රාදේශික හා පරිමිත භාෂා පිළිබඳ දැනුවත් වීම මගින් සිංහල භාෂාව හා සිංහල ජනතාව පිළිබඳ වැදගත් වුත් රසවත් වුත් තොරතුරු උකහා ගැනීමට හැකි ය. සාහිත්‍ය නිර්මාණකරණයේ දී භාෂාව සකස් කර ගැනීමට ද මින් අවස්ථාව උදා වේ. චිරන්තන සිංහල සාහිත්‍යය පිළිබඳ විද්‍යාත්මකව විමර්ශනය කිරීමට ප්‍රාදේශික හා පරිමිත භාෂා දැනුම වැදගත් වේ. ජනතාවගේ සංස්කෘතික රටාව හැදෑරීමට මින් ලැබෙන පිටුබලය ඉමහත් ය.

## අවබෝධය - 11 ශ්‍රේණිය (14) - රසින් රස මවන බස් මහිමය

1. ප්‍රාදේශික උපභාෂා ඇති වීමට බලපෑ හේතු තුනක් දක්වන්න.
2. සිංහල භාෂාවේ ප්‍රාදේශික උපභාෂා කලාප කිහිපයක් නම් කරන්න.
3. පරිමිත භාෂා සඳහා නිදසුන් දක්වන්න.
4. ප්‍රාදේශික උපභාෂා අධ්‍යයනයෙන් ලද හැකි ප්‍රයෝජන නම් කරන්න.
5. ප්‍රාදේශික උපභාෂා පොදු භාෂාවෙන් වෙනස් වන්නේ කවර අංශවලින් ද?

## අවබෝධය - 10 ශ්‍රේණිය (03) - ප්‍රාදේශික ව්‍යවහාර

1. ප්‍රාදේශික ව්‍යවහාර යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
2. මොනරාගල ප්‍රදේශයේ යමකුට විධානයක් දෙන ජනවහර කෙසේ ද?
3. එහි විධානයක් ආදරයෙන් පැවසීමේ දී දැකිය හැකි විශේෂ ලක්ෂණය කුමක් ද?
4. මොනරාගල වැසියන් යමකුගෙන් ප්‍රශ්නයක් අසන අයුරු පොදු සිංහල රීතියට වඩා වෙනස් යැ යි පවසන්නේ කුමක් නිසා ද?
5. විවිධ පළාත්වල ඥාතීන් හැඳින්වීමට භාවිත කෙරෙන ප්‍රාදේශික ව්‍යවහාර දක්වන්න.
6. විවිධ පළාත්වල භාවිත කෙරෙන ප්‍රාදේශික ව්‍යවහාර ක්‍රියා පද දක්වන්න.
7. පහත සඳහන් පොදු සිංහල වචන සඳහා යෙදෙන ප්‍රාදේශික ව්‍යවහාර පාඩමෙන් උපුටා ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1) දොරවල් | ............................ | 4) අඹ | ............................ |
| **2)** හාමිනේ | ............................ | **5)** පුහුල් | ............................ |
| **3)** ඉර පැව්වා | ............................ | 6) කුරුල්ලා | ............................ |

## අවබෝධය - 11 ශ්‍රේණිය (12) - බස ඉපදුණු සැටි අසනු ය විස්තර

1. පාඩමේ ඇතුළත් ගුවන්විදුලි සාකච්ඡාවට පදනම් වී ඇති කාරණය කුමක් ද?
2. භාෂාවේ ආරම්භය පිළිබඳ මූලික මතවාද නිර්මාණය වී ඇත්තේ කුමන කාරණා පදනම් කර ගෙන ද?
3. භාෂාවේ උපතට සමගාමීව සිදු වූ මානවයාගේ වර්ධනීය අවස්ථාව කුමක් ද?
4. ලෝකයේ පවත්නා භාෂා ගණන නිශ්චිතව ප්‍රකාශ කිරීමට නො හැක්කේ කුමන හේතු නිසා ද?
5. භාෂාව සංස්කෘතියේ වාහකය ලෙස හඳුන්වන්නේ ඇයි?

# අරුත් පැහැදිලි කිරීම

- **සංස්කෘතික ජයග්‍රහණය** - මානව සමාජය විසින් සංස්කෘතික විකාසනයේ ප්‍රතිඵල වසයෙන් ඇති කර ගන්නා ලද හැකියා හා සොයා ගැනීම්.

- **පරිණාමවාදය** - යමක ක්‍රමික විකාසනය යි. අතීතයේ විසූ ජීවීන් විවිධ වෙනස්කම්වලට ලක් වීමෙන් අද දක්නට ලැබෙන ජීවීන් ඇති වූ බව පවසන න්‍යාය පරිණාමවාදය යි. ජීවීන් මෙන් ම සමාජය හා සංස්කෘතිය ද ක්‍රමයෙන් විකාසනය වන බව මේ න්‍යායෙන් පැහැදිලි කෙරේ.

- **පුනරුත්පත්තිය** - පුනර් + උත්පත්තිය, නැවත ඉපදීම.

- **කල්ප විනාශයකින්** - හින්දු හා බෞද්ධ ග්‍රන්ථවලට අනුව ලෝකයේ හෝ විශ්වයේ හෝ ආරම්භයේ සිට අවසානය තෙක් කල්පයකි. එක් කල්පයක් කෙළවර ලෝකය විනාශයට පත් වෙතැයි කියනු ලැබේ.

- **ක්ෂුද්‍ර ප්‍රාණීන්** - පියවි ඇසට නො පෙනෙන අතිශය කුඩා ජීවීන්.

- **පාෂාණීභූත** - ෆොසිල බවට පත් වූ අතීතයේ විසූ සතුන් හා ශාක සහමුලින් ම හෝ කොටස් වසයෙන් මෙන් ම සතුන්ගේ අඩි සටහන් වැනි දෑ ද ඒවාහි මුල් ස්වරූපය පෙන්නුම් කෙරෙන පරිදි පස් බවට පත් වී ආරක්ෂා වී තිබීම.

- **ශීර්ෂ කපාලය** - හිස් කබල.

- **කාල සීමා තීර්ණය** - කුමන කාලයකට අයත් දැයි විද්‍යාත්මක ක්‍රම උපයෝගි කර ගනිමින් තීරණය කිරීම.

- **සම්මුතිය** - පිළිගැනීම/එකඟතාව.

- **භාෂා උපාර්ජනය** - මිනිස් ළදරුවකු භාෂාවක් ඉගෙන ගන්නේ තමා අවට ව්‍යවහාර වන භාෂාව ශ්‍රවණය කිරීමෙනි. ඒ සඳහා ඔහුගේ ශරීරයේ ඉන්ද්‍රිය කිහිපයක් විශේෂයෙන් හැඩ ගැසී තිබේ.

- **භාෂා ඥාතිත්වය** - ලෝකයේ ව්‍යවහාර කෙරෙන විවිධ භාෂා එක් පොදු භාෂාවකින් ඇති වී වෙනස් භාෂා බවට පත් වී ඇති බව පිළිගැනේ. එවැනි සම්බන්ධතා සහිත භාෂා එක ම භාෂා පවුලකට අයත් සේ සැලකෙයි. සිංහල භාෂාව නතූන ඉන්දියානු භාෂා වන හින්දි, බෙංගාලි, ගුජරාටි, උර්දු ආදි භාෂා සමග මෙන් ම පැරණි ඉන්දියානු භාෂා වන සංස්කෘත හා පාලි සමගත් ඉංගිරිසි, ප්‍රංස, ජර්මන් ආදි නූතන යුරෝපීය භාෂා හා පැර, ග්‍රීක්, ලතින් භාෂා සමඟත් ඥාතිත්වයක් ඇති භාෂාවකි. මේ සියල්ල එක් භාෂා පවුලකට (ඉන්දු- යුරෝපීය භාෂා පවුල) අයත් සේ වර්ග කෙරේ.

- **මූල භාෂා** - ඥාතිත්වයක් සහිත විවිධ භාෂා සියල්ලට ම පොදු වූ පැර, එක් භාෂාවක් පැවති බව භාෂාඥයන්ගේ මතය යි. ඉහත විස්තර කළ ඉන්දු-යුරෝපීය පවුලට අයත් භාෂාවලට මුල් වූයේ එවැනි එක් පැරණි භාෂාවක් බව සැලකෙයි. එය ඉන්දු-යුරෝපීය මූල භාෂාව යනුවෙන් නම් කෙරේ.
- **වෘත්තාන්තයක්** - කතාවක්

- **වාහකයා** - ගෙන යන්නා

- **අවියෝජනීය** - වෙන් කළ නො හැකි

- **අනන්‍යතාව** - තමාට ම අයත් බව

# 14. ප්‍රාදේශික ව්‍යවහාර - පසුගිය විභාග ප්‍රශ්න

2019 oL

38. හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ 'මහ එකා' යනු,

(1) පිඹුරා ය. (2) ලොකු පුතා ය.
(3) තයා ය. (4) අලියා ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

"මානවයාගේ තිබුණ ශක්‍යතා අතර එකක් තමයි භාෂා ශක්‍යතාව. ඒ කියන්නේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා ශබ්ද නිකුත් කිරීමේ හැකියාව."

(1) මනුෂ්‍යයා සතු හැකියාවක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් ගම්‍ය වනුයේ ශබ්ද නිකුත් කිරීමේ හැකියාව යි.
(2) මානවයා සතු ශක්‍යතාවක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් කියැවෙන්නේ අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව යි.
(3) මානවයා සතු සුවිශේෂ හැකියාවක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් අදහස් වනුයේ ශබ්ද උත්පාදනමය ශක්‍යතාව යි.
(4) මානවයා සතු හැකියාවන් අතර එකක් වනුයේ භාෂා ශක්‍යතාව යි. ඉන් කියවෙනුයේ අදහස් ප්‍රකාශනය සඳහා ශබ්ද උත්පාදනය කිරීමේ හැකියාව යි.

---

2018 oL

5. භාෂාවක අර්ථ ප්‍රකට කිරීමෙහි ලා ............................ ඉතා වැදගත් ය.

(1) ශබ්දෝච්චාරණය (2) සුබෝච්චාරණය (3) සාවද්‍යෝච්චාරණය (4) අනූච්චාරණය

38. හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'වාංපතුල්' යනු,

(1) මර උගුල් ය. (2) වඳුරන්ගේ පාදයන් ය.
(3) පාවහන් ය. (4) සතුන්ගේ හම්පොතු ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

"මතු පිටින් පෙනෙන වාච්‍යාර්ථය නොව ව්‍යංග්‍යාර්ථය ද අවබෝධ කළ යුතු ය. බසේ බුද්ධිගෝචර වන කොටස පමණක් නො ව හෘදයගෝචර වන කොටස ද දත යුතු ය."

(1) වචනාර්ථය හා ව්‍යංග්‍යයෙන් කියවෙන අර්ථ අවබෝධ කළ යුතු අතර හදවතට හා බුද්ධියට ගෝචර වන කොටස් දැන ගැනීම ප්‍රමාණවත් ය.
(2) මතු පිටින් පෙනෙන අර්ථ හා ව්‍යංග්‍යයෙන් කියැවෙන කොටස් අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.
(3) වචනයේ මතු පිට අර්ථය මෙන් ම ව්‍යංග්‍යයෙන් කියැවෙන අර්ථය ද බුද්ධියට ගොදුරු වන කොටස මෙන් ම හදවතට ගොදුරු වන කොටස ද අවබෝධ කර ගත යුතු ය.
(4) මතු පිටින් පෙනෙන වචනාර්ථය අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.

---

2017 oL

14. සන්නිවේදන **ශක්‍යතාව**, භාෂාව නිසා මිනිසාට ලැබුණු උරුමයකි.

(1) හැකියාව (2) මාර්ගය (3) පුරුද්ද (4) ප්‍රබලතාව

21. 'භාෂාවේ උපත සම්බන්ධයෙන් මත කිහිපයක් පළ වී තිබේ.' යන වාක්‍යයේ 'උපත' යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් යෝග්‍ය පදය කුමක් ද?

(1) ප්‍රතිලාභය (2) සම්භවය
(3) පුනරුප්පත්තිය (4) පරිණාමය

38. ධීවර ජනවහරේ දී ජම්පර කළුව වශයෙන් හඳුන්වන්නේ,

(1) වර්ෂාවයි. (2) වැහිකබායයි. (3) මාළු දැලයි. (4) සන්ධ්‍යා කාලයයි.

---

2016 oL

38. හේන් ගොවිතැන ආශ්‍රිත බස්වහරේ දී අලියන් වේලාව යනු,

(1) අලි ගමන් කරන වේලාවයි. (2) රාත්‍රි කාලයයි.
(3) අඳුර වැටෙන වේලාවයි. (4) උදෑසන කාලයයි.

---

40. පයින් ගොයම් පාගන විට එළන පැදුර සඳහා කමත් භාෂා ව්‍යවහාරයේ දී හඳුන්වන්නේ,

1. කුටාලම 2. මාගල 3. යතුර 4. දෙබර අත්ත

Term test

❖ රුහුණු උපභාෂාව - පිළිතුරු

1. හින්නා
2. ඔහේ
3. බාපම්මා
4. කොණ්ඩුව
5. කළුකපාළුළිය
6. ඔයනවා
7. මක්කයි
8. කරිප්ප
9. සුමක්කරය
10. හිච්චි/හින්නි

❖ උඩරට උපභාෂාව - පිළිතුරු

1. ඇම්බරයා
2. අප්පල්ලේ
3. කේලම්කාරයා
4. පහිනය
5. ගුත්තා
6. හිනිම්දිරිය
7. අකරතැබ්බය
8. පුන්නනවා

❖ දිගාමඩුලු උපභාෂාව - පිළිතුරු

1. මෝ/මොවී
2. හොටි අම්මා
3. කැටා
4. බෝල්ලු
5. පරියා
6. කායම
7. පුක්කා
8. හේමලයා
9. පිළිහොඳ වීම
10. විසාදිය

❖ සත්කෝරළේ උපභාෂාව - පිළිතුරු

1. වයිතාලය
2. හබය
3. කුඩහලුවා
4. සුමේ
5. මුලිච්චි වීම/හදි ගැසීම
6. තතනනවා
7. පතහ
8. සුම්බරේ
9. වල් ඇල්ලීම

❖ සබරගමු උපභාෂාව - පිළිතුරු

1. පැලපදියම් වීම
2. ගඟුල බානවා
3. පතිත්තලයා
4. මඩම්
5. කුරුවෙ රාජකාරිය
6. මඩු පැල

❖ නුවර කලාවියේ උපභාෂාව - පිළිතුරු

1. බක්කා
2. මායියා
3. කෙකිනිපත් ගැසීම
4. මදාවියා
5. සතුහරේ
6. පැල්ගැහීම
7. නවදැලි හේන
8. දියදොස්
9. එල්ලංගාව

❖ කමත් භාෂාව - පිළිතුරු

1. අළුහත් වැඩීම
2. උප්පිඩි
3. හරක් කැරුල්ල/ඇඳුත්ත
4. මුදුනා
5. කොළමුත්තා, එලවිස්සා, මට්ටයා, කලාතයා
6. බාන
7. යතුර
8. මාගල
9. කුටාලම
10. දෙබර අත්ත

❖ ධීවර භාෂාව - පිළිතුරු

1. පන්න කරනවා
2. වියල් ඔරු
3. හැන්
4. මරක්කලාහේ
5. හැන්නදිරාල
6. බිලී මන්ද
7. ජම්පර කළුව
8. ජාලය
9. අම්බාවෝ/ජාලියෝ
10. අලුයම්පොළ

❖ **හේන් භාෂාව - පිළිතුරු**

1. වාංපතුල්
2. බුඩා
3. සකලයෝ
4. කුරුළු පාළුව
5. අළු පොළ
6. ගැදැල්ල ගැම
7. අලියන් වෙලාව
8. මහ එකා

❖ **පතල් භාෂාව - පිළිතුරු**

1. ඉල්ලම
2. දබරය
3. ඉල්ලම් කුර
4. සන්නම්
5. දෝනාව
6. කැට කුඩය
7. කට්ට කුඩය
8. නාම්බුව
9. ගල දීම



❖ **ශ්‍රී පාද වන්දනාව ආශ්‍රිත භාෂාව පිළිතුරු**

1. දෙයියන්නෙ රට
2. කරුණා කිරීම
3. නඩේ ගුරා
4. කෝඩුකාරයා
5. සැහැල්ලුව
6. ගඟුල බානවා

❖ **ප්‍රාදේශික ව්‍යවහාර - පසුගිය විභාග ප්‍රශ්න පිළිතුරු**

**2019 0/L** 38) 04
40) 04

**2018 0/L** 05) 01
38) 03
40) 03

**2017 0/L** 14) 01
21) 02
38) 02

**2016 0/L** 38) 03

Term Test 40) 02